# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. RG/AB/24/වා.ස්.මා./2022 (දෙපා.)

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය
த. பெ. இல.
P. O. Box No. 565

ඔබේ අංකය
உமது இல.
Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය
திகதி
Date 2022.08 03


අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ භාර මාණ්ඩලික ප්‍රධානීන්,

කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

මධ්‍යම ලේඛනාගාරය භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,

දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

**අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් සේවය/ ලේඛන සහකාර සේවය / පොත් බැඳුම්කරු සේවය යන සේවාවන්හි නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2022 (දෙපාර්තමේන්තු ඇතුළත)**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.09.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව ඇතුළත වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතුව ඇත.

02. එම විධිවිධාන අනුව 2022 වර්ෂයේ දෙපාර්තමේන්තුව ඇතුළත වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ යටතේ සිටින ඉහත සඳහන් සේවාවන්හි නිලධාරින්ගෙන් ස්ථාන මාරු අයදුම්පත් කැඳවනු ලැබේ. ස්ථාන මාරු කමිටු 2022.08.25 දිනට රැස්වීමට නියමිත බැවින් එම අයදුම්පත් ලේඛනගත කර සම්පූර්ණ කර වාර්ෂික ස්ථාන මාරු කමිටුව වෙත ඉදිරිපත් කල යුතුව ඇත. එබැවින් එම නිලධාරින් විසින් සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන ස්ථාන මාරු අයදුම්පත් වල ඔබගේ නිර්දේශය පැහැදිලිව සඳහන් කර 2022.08.25 දිනට පෙර එම අයදුම්පත් මා වෙත ලැබීමට සලස්වන්න. එම වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමේදී මේ සමඟ අමුණා ඇති උපලේඛන අංක ( I ) ("දෙපාර්තමේන්තුව ඇතුළත වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් උපලේඛනය -2022 වර්ෂය") ආකෘතියට අනුව අයදුම්පත්වල තොරතුරු ඇතුළත් කොට අදාළ අයදුම්පත් ද සමඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න. ලිපිකවරයේ වම් පස "දෙපාර්තමේන්තුව ඇතුළත වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් - 2022" ලෙස සඳහන් කර රෙජිස්ට්‍රාර් ජනරාල්,රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,234/A3,කොබ්බෑකඩුව මාවත,බත්තරමුල්ල ලිපිනයට නියමිත දිනට පෙර එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් සම්බන්ධව සලකා බැලීම නොකරන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.


දුරකථන අංකය
தொலைபேசி இல.
Telephone No. 2889488 2889489

ෆැක්ස් අංකය
தொலைநகல்
Fax No. 2889491

වෙබ් අඩවිය
இணையத்தளம்
Website www.rgd.gov.lk

විද්‍යුත් තැපෑල
மின்னஞ்சல்
E-mail rgd@sltnet.lk rg@rgd.gov.lk

03. ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මේ සමඟ අමුණා එවන 'දෙපාර්තමේන්තු ඇතුළත වාර්ෂික ස්ථාන මාරු' ආකෘතිය අනුවය. එම ආකෘතිය මඟින් ඉදිරිපත් නොවන ස්ථාන මාරු ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන බවද වැඩිදුරටත් දන්වා සිටිමි. එක් සේවා ස්ථානයක අවුරුදු 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් විසින් ස්ථාන මාරු අයදුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

04. තවද, එක් සේවා ස්ථානයක අවුරුදු 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් ඔබ කාර්යාලයේ වෙත් නම්, අනිවාර්යෙන්ම ඔවුන් සියළුදෙනා පිළිබඳ නිරවද්‍ය තොරතුරු මේ සමඟ අමුණා ඇති උපලේඛන අංක ( II ) අකෘති පත්‍රයේ ඇතුළත් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

04.(i). අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් සේවයේ නිලධාරීන් සඳහා පමණක් වසර 05 යනු එකම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයක වසර 05ක් අඛණ්ඩව සේවය කිරීම හෝ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල කිහිපයක වසර 05ක් සේවය කිරීම ලෙස සලකනු ලැබේ.

මින් පෙර වර්ෂවලදී සමහර කාර්යාලවලින් සිතාමතා මෙම තොරතුරු ඉදිරිපත් කිරීම පැහැර හැර තිබුණි. එබැවින් එම නිලධාරින්ගේ සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම අනිවාර්ය බව අවධාරණය කරමි.

05. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ කටයුතු සිදු කෙරෙන බැවින් මෙම ක්‍රියාවලියේදී එම විධිවිධානයන්ට අනුකූලව කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

පී.එස්.පී.අබේවර්ධන

රෙජිස්ට්‍රාර් ජනරාල්

<u>පිටපත්:</u>

01. ලේකම්, රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස